# සර්වඥ ධාතූන්ට ජීවමාන බුදු රජාණන් වහන්සේට මෙන් පුද පූජා පවත්වා නිවන් දකිනතුරු සුගතිගාමී වන්න

## ධාතුපූජක ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 390 - 393)

සිද්ධාර්ථ බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පෑ පසු බුදු රජාණන් වහන්සේගේ එක් ධාතුවක් ලබා ගත් අයෙක් එයට ජීවමාන බුදු රජාණන් වහන්සේට මෙන් අවුරුදු පහක් පුද පූජා කළා. උවටැන් කළා.

එහි විපාකය ලෙස ඔහු කල්ප අනූ හතරක් දුගතියක ඉපදුණේ නැහැ. අවසාන ආත්ම භාවය ලෙස ගෞතම බුදු සසුනේ රහතන් වහන්සේ නමක් ව සසර ගමන කෙළවර කළා.